www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සසප කොළඹ දී මැයි දින රැස්වීමක් පැවැත්වීමට සූදානම් වේ

## Sri Lankan SEP to hold May Day meeting in Colombo

**2007 අප්‍රේල් 26**

සමාජවාදී සමානතා පක්ෂය (සසප) ජාත්‍යන්තර කම්කරු දිනය සමරනු වස් මැයි 1 දා කොළඹ දී ප්‍රසිද්ධ රැස්වීමක් පැවැත්වීමට සූදානම් වේ. එලඹෙන අධිරාජ්‍යවාදී යුද තර්ජනයටත් ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට හා ජීවන මට්ටම්වලට එල්ල කෙරෙන ගැඹුරු වන ප්‍රහාරයන්ටත් එරෙහිව සටන් කිරීමේ දී, ලොව පුරා කම්කරු පන්තියේ එකමුතුව හදිසි දේශපාලන අවශ්‍යතාවක් බවට අද පත්ව ඇත.

සිය ඓතිහාසික කඩා වැටීමට එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ප්‍රතිචාරය වී ඇත්තේ සම්පත්වලින් පොහොසත් මැද පෙරදිග හා මධ්‍යම ආසියාව මත සිය ආධිපත්‍යය පටවනු පිනිස මිලිටරි බලයේ සරන සොයා යෑම යි. ඇෆ්ඝනිස්ථානයේ දී හා ඉරාකයේ දී මුහුන දී ඇති පසුබෑසීම් නොතකා බුෂ් පාලනාධිකාරය ඉරානයට එරෙහිව තවත් සාපරාධී මදාවියක් සඳහා කිසිදු ඉවබවක් නැති සූදානමක යෙදී සිටී. මෙම යුද්ධ වොෂිංටනයේ යුරෝපීය හා ආසියානු ප්‍රතිවාදීන් සමග වඩා පුලුල් හා ව්‍යසනකාරී ගැටුම් සඳහා වේදිකාව සකසයි.

එමෙන් ම, සෑම රටක ම කම්කරුවෝ රැකියා, ජීවන කොන්දේසි හා ප්‍රජාතන්ත්‍ර අයිතීන් මත එල්ල වන අවසානයක් නැති ප්‍රහාරයන්ට මුහුන දී සිටිති. ඉන්දියාවේ බටහිර බෙංගාල ප්‍රාන්තයේ ස්ටැලින්වාදී ඉන්දියානු (මාක්ස්වාදී) කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වයෙන් යුත් ආන්ඩුව බහු ජාතික සමාගම් විසින් සිය ඉඩම් අල්ලා ගැනීමට විරෝධය දක්වන ගොවීන්ට එරෙහිව පොලීසිය මුදා හැර 14ක් මරා දමා තිබේ. පකිස්ථානයේ මිලිටරි බලවතා වන ජෙනරාල් පර්වේෂ් මුෂාරෆ් ජීවන මට්ටම් කඩා වැටීමට සහ එක්සත් ජනපදයේ ව්‍යාජ "ත්‍රස්ත විරෝධී යුද්ධය" සඳහා ඔහු දෙන සහයෝගයට එරෙහි විරුද්ධත්වය තලා දමනු පිනිස ප්‍රජාතන්ත්‍ර විරෝධී විධි ක්‍රම යොදා ගනී.

ශ්‍රී ලංකාවේ දී, ජනාධිපති මහින්ද රාජපක්ෂ දිවයිනේ ව්‍යසනකාරී යුද්ධය යලි අවුලුවා ඇත. පසු ගිය වසර තුල 4,000කට වඩා ඝාතනයට ලක්ව 300,000කට සිය නිවාස අහිමි වී තිබේ. ගැඹුරින් ම ජන විරෝධයට ලක්ව ඇති යුද්ධයටත් එහි ආර්ථික බරටත් එරෙහි විරුද්ධත්වය මඩිනු පිනිස ආන්ඩුව හා මිලිටරිය පොලිස් රාජ්‍ය විධි ක්‍රමවලට -- මාධ්‍ය බිය ගැන්වීම, නඩු විභාග නොමැතිව හිතුවක්කාරී ලෙස රඳවා ගැනීම සහ මිනිසුන් සිය ගනන් මරා දැමීමට හෝ "අතුරුදහන් කිරීමට" ඝාතක කල්ලි යොදා ගැනීම -- හැරෙමින් සිටී.

මනුෂ්‍ය වර්ගයා පැහැදිලි විකල්පයන්ට මුහුන දී සිටී: එනම් සමාජවාදය හෝ ම්ලේච්ඡත්වය. යුද්ධයට හා සමාජ අසමානතාවට එරෙහිව ලොව වටා කම්කරුවන්ගේ ස්වාධීන ව්‍යාපාරයක් ගොඩ නැගීමට වහාම අවශ්‍ය සමාජවාදී ඉදිරිදර්ශනය සාකච්ඡා කරනු පිනිස අපගේ රැස්වීමට සහභාගි වන ලෙස කම්කරුවන්ට, බුද්ධිමතුන්ට හා විශේෂයෙන් ම තරුන ජනයාට අපි කැඳවුම් කර සිටිමු.

**දිනය හා වේලාව: මැයි 1 දා සවස 3.00**

**ස්ථානය: කොළඹ නව නගර ශාලාව.**

© www.wsws.org